Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

විද්‍යාව I

කාලය පැය 2 යි

නම / විභාග අංකය:

01. වෛරස මගින් ඇතිවන රෝගයක් වන්නේ,
1. සෙම්ප්‍රතිශ්‍යාව
2. මැලේරියාව
3. ක්ෂය රෝගය
4. කොළරාව

02. මිනිස් ඇසේ ව්‍යුහය හා අදාළ කෘත්‍ය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
1. රුධිර ග්‍රාහිය - ආලෝකය ඇස තුළට ඇතුළුවීම වළකාලීම
2. කාච රසය - ඇසෙහි ගෝලාකාර හැඩය පවත්වා ගැනීම
3. තාරා මණ්ඩලය - දෘෂ්ටි විතානය මත ප්‍රතිබිම්බ නාභිගත කිරීම
4. ප්‍රතියෝජක පේශිය - ඇසට ඇතුළුවන ආලෝකය පාලනය

03. ග්ලූකෝස් ($C_6H_{12}O_6$) අණුවක ඇති මූලද්‍රව්‍ය ගණන කීයද?
1. 3 කි.
2. 6 කි.
3. 12 කි.
4. 24 කි.

04. A බඳුන තුළ බීමට ගන්නා ජලය ඇත. B බඳුන තුළ බීමට ගන්නා ජලයේ සීනි හැඳි 2ක් දියකර ඇත.
1. A සමජාතීය මිශ්‍රණයකි. B විෂමජාතීය මිශ්‍රණයකි.
2. A විෂමජාතීය මිශ්‍රණයකි. B සමජාතීය මිශ්‍රණයකි.
3. A විෂමජාතීය මිශ්‍රණයකි. B විෂමජාතීය මිශ්‍රණයකි.
4. A සමජාතීය මිශ්‍රණයකි. B සමජාතීය මිශ්‍රණයකි.



05. හදිසි අනතුරක දී කනට යමක් තදින් වැදීමෙන් පසු පුද්ගලයෙකුට සමබරව සිටගෙන සිටීමේ අපහසුව ඇති විය. මෙහි දී හානි වී ඇතැයි අනුමාන කළ හැක්කේ,
1. බාහිර ශ්‍රවණ නාලයට ය.
2. අර්ධ චක්‍රාකාර නාලවලට ය.
3. ශ්‍රවණ ස්නායුවට ය.
4. කර්ණ අස්ථිකා වලට ය.

06. වර්ග ඵලය $5m^2$ ක් වූ පෘෂ්ඨයකට අභිලම්බව 50N ක බලයක් යොදන ලදී. පෘෂ්ඨය මත පීඩනය දැක්වෙන ප්‍රකාශනය වන්නේ,
1. $\frac{50N}{5m^2}$
2. $50N \times 5m^2$
3. $\frac{5m^2}{50N}$
4. $\frac{1}{5m^2 \times 50N}$

07. මිනිස් හෘදය තුළ ද්විතුණ්ඩ කපාටය පිහිටා ඇත්තේ,
1. දකුණු කර්ණිකාව හා දකුණු කෝෂිකාව අතර ය
2. වම් කර්ණිකාව හා වම් කෝෂිකාව අතර ය
3. දකුණු කෝෂිකාව හා පුප්පුසීය ධමනිය අතර ය
4. වම් කෝෂිකාව හා සංස්ථානික ධමනිය අතර ය

08. නොගැළපෙන රුධිරය මිශ්‍ර වූ විට ප්‍රතිග්‍රාහකයාගේ සිරුර තුළ රුධිරය කැටිගැසීම හඳුන්වන්නේ,
1. රුධිර ශ්ලේෂණය ලෙසිනි
2. රුධිර පාරවිලයනය ලෙසිනි
3. රුධිර වහනය ලෙසිනි
4. ලියුකේමියා තත්ත්වය ලෙසිනි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

09. වල්නාශකයක් ලෙස යොදාගත හැකි කෘත්‍රිම වර්ධක ද්‍රව්‍යය කුමක් ද?
1. ඉන්ඩෝල් ඇසිටික් ඇසිඩ්
2. සයිටොසෝල්
3. නැප්තලින් ඇසිටික් ඇසිඩ්
4. 2.4 ඩයික්ලොරෝ ෆීනොක්සි ඇසිටික් ඇසිඩ්

10.



පැරමීසියම්

ගොලුබෙල්ලා

ඇමීබා

ඉහත ජීවීන්ගේ සංචරණ උපාංග පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ව්‍යාජ පාද, කශිකා, පේශිමය පාදය
2. පේශිමය පාදය, කශිකා, ව්‍යාජ පාද
3. පක්ෂ්ම, පේශිමය පාදය, ව්‍යාජ පාද
4. කශිකා, පේශිමය පාදය, ව්‍යාජ පාද

11. ජෛව පොසිලයක් ලෙස හඳුනාගත් ජීවියෙකු වන්නේ,
1. ගොලුබෙල්ලා
2. තිලාපියා
3. කැරපොත්තා
4. මදුරුවා

12. පහත ඝනකයේ ස්කන්ධය 1000kg නම් එහි ඝනත්වය කොපමණ ද?



1. $100 kgm^{-3}$
2. $1000 kgm^{-3}$
3. $1100 kgm^{-3}$
4. $3000 kgm^{-3}$

13. ආක්‍රමණශීලී සතෙකු ලෙස හඳුනාගෙන ඇත්තේ,
1. මන්නාවා
2. අසෝක පෙතියා
3. බුලත් හපයා
4. හිරිකනයා

14. පරිසරය තුළ සිදුවන ජීවී අජීවී අන්තර් ක්‍රියාවක් ලෙස හැඳින්විය හැක්කේ,
1. කොළ රොඩු දිරාපත්වීම
2. සතුන් ශාක ආහාරයට ගැනීම
3. පස සෝදායාම
4. යකඩ මළබැඳීම

15. කෘෂිකර්මාන්තයේ හරිත සංකල්පයක් ලෙස හඳුනාගත නොහැක්කේ පහත ප්‍රකාශ අතරින් කවරක් ද?
1. කාබනික පොහොර යොදා පස සරු කිරීම.
2. බෝග මාරුව මඟින් පළිබෝධ හානි අවම කිරීම
3. රසායනික පොහොර පමණක් භාවිතයෙන් අස්වැන්න වැඩි කිරීම.
4. බිංදු ජල සම්පාදනයට නැඹුරුවීම

16. a b කිරණයේ නිවැරදි ගමන් මාර්ගය වන්නේ,
1. b c ය
2. b d ය
3. b e ය
4. b f ය



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17. ජෛව විවිධත්වය,
    1. ජීවී විශේෂ අතර තරඟය වැඩි කරයි.
    2. පරිසර පද්ධති තුළ අසමතුලිත බව ආරක්ෂා කරයි.
    3. පරිසර දූෂණය ඉහළ නංවයි.
    4. දේශගුණික සාධක හිතකරව පවත්වා ගැනීමට වැදගත් වේ.

18. ඛනිජයක් ලෙස සැලකිය හැක්කේ,
    1. මිනිරන් 2. ග්‍රැනයිට් 3. බැසෝල්ට් 4. නයිස්

19. ලීවරයක රූප සටහනක් පහත දැක්වේ.



මෙහි X, Y, Z නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

	X	Y	Z
1.	ධරය	භාරය	ආයාසය
2.	ආයාසය	ධරය	භාරය
3.	භාරය	ධරය	ආයාසය
4.	ධරය	ආයාසය	භාරය

20. පහත වගන්ති කෙරෙහි අවධානය යොමු කරන්න.
    A ප්‍රකාශය - අකුණක ආරෝපණ විසර්ජනයේ දී අධික තාපයක් පිටවේ.
    B ප්‍රකාශය - අකුණක දී වාතය ක්ෂණිකව ප්‍රසාරණය වීමෙන් ගිගිරුම් හඬ ඇතිවේ.

    ඉහත ප්‍රකාශන අතරින්,
    1. A හා B ප්‍රකාශන දෙකම සත්‍ය වේ.
    2. A හා B ප්‍රකාශන දෙකම අසත්‍ය වේ.
    3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
    4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

විද්‍යාව II

නම / විභාග අංකය:

- ★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න 6 න් 4 කට පිළිතුරු සපයන්න.
- ★ පිළිතුරු ලිවීමට වෙනම කොළයක් භාවිත කරන්න.

01. A. මිනිසාගේ වැලමිට සන්ධියේ ක්‍රියාකාරිත්වය ආදර්ශනය සඳහා සැකසූ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ. C සහ D යනු මඳක් වාතය පිරවූ බැලූන 2කි.



i. A ලී කැබැල්ල මගින් ආදර්ශනය වන අස්ථිය කුමක් ද? (ලකුණු 01)
ii. ද්වි ශිර්ෂ පේශිය නිරූපණය වන්නේ කුමන අක්ෂරයෙන් ද? (ලකුණු 01)
iii. අත දිග හැරීමට අවශ්‍ය ශක්තිය සපයන පේශියේ නම ලියන්න. (ලකුණු 01)
iv. චලන සඳහා ශක්තිය සැපයීමට පේශී සෛල වල ඇති විශේෂ ලක්ෂණයක් දක්වන්න. (ලකුණු 01)
v. බිම ඇද වැටුන ශාකයක අග්‍රස්ථ අංකුරය පොළොවෙන් ඉහළට හැරී ආලෝකය දෙසට ගමන් කරයි.
(a) මෙම සිදුවීම ධන ආවර්තී චලනයක් ලෙස පැහැදිලි කරන්න. (ලකුණු 01)
(b) පොළොවෙන් ඉහළට හැරී ගමන් කිරීම කුමන ශාක චලන වර්ගයට අයත්වේ ද? (ලකුණු 01)
vi. නිද්‍රාසන්නමන ශාක චලන දක්වන ශාකයක් ලියන්න. (ලකුණු 01)

B ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය අතින් පොහොසත් රටක් ලෙස ලොව පුරා ප්‍රචලිත වී ඇත. ජෛව විවිධත්වය විවිධ මට්ටම් වලින් සාකච්ඡා කළ හැකිය.

i. එකම විශේෂය තුළ ජෛව විවිධත්වය දැක්වීමට උදාහරණයක් ලියා දක්වන්න. (ලකුණු 01)
ii. කිවුල්දිය ජලජ පරිසර පද්ධතියක් සඳහා උදාහරණයක් ලියන්න. (ලකුණු 01)
iii. විදුලිය නිපදවීම සඳහා යොදගත හැකි ජලජ පරිසර පද්ධති දෙකක් දක්වන්න. (ලකුණු 02)
iv. කඳුකර වනාන්තර ශාකවල දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න. (ලකුණු 01)

C පාසල් විද්‍යාගාරයේ සිදුකළ ක්‍රියාකාරකමක අවස්ථාවක් පහත රූපසටහනින් දැක්වේ.

i. x ලෙස නම් කර ඇති උපකරණය කුමක් ද? (ලකුණු 01)
ii. එහි ඇති බීකරයට ජලය හා පොල්තෙල් $500cm^3$ පරිමාවක් බැගින් යොදා වෙන වෙනම ස්කන්ධ කිරාගන්නා ලදී. ඒවායේ ස්කන්ධ සමාන වේ ද? අසමාන වේ ද? (ලකුණු 01)
iii. ඔබේ පිළිතුරට හේතුව කුමක් ද? (ලකුණු 01)
iv. ද්‍රව මානය භාවිතයට ගන්නා අවස්ථාවක් ලියන්න. (ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. A. පදාර්ථයේ වර්ගීකරණය පිළිබඳ සටහනක් පහත දැක්වේ.



i. a හා b යන හිස්තැන්වලට අදාළ පිළිතුරු ලියන්න. (ලකුණු 01×2=2)

ii. මූල ද්‍රව්‍ය හා සංයෝග අතර ප්‍රධාන වෙනස්කමක් ලියන්න. (ලකුණු 02)

iii. ජල අණුවක නිරූපණයක් පහත දැක්වේ. ඉහත සටහනේ එයට ගැළපෙන ස්ථානය කුමක් ද? (ලකුණු 01)



B. පහත දැක්වෙන්නේ මිශ්‍රණ කිහිපයක සංඝටක වෙන් කිරීම සඳහා යොදාගත් උපකරණ කට්ටල කිහිපයකි.



A B C D

i. පහත දැක්වෙන මිශ්‍රණවල සංඝටක වෙන් කිරීම සඳහා ගැළපෙන උපකරණ කට්ටලය තෝරා එහි අක්ෂරය ලියන්න.

a. යකඩ කුඩු + ගෙන්දගම් ....

b. ජලය + ලුණු ....

c. රටහුණු කුඩු + ජලය .... (ලකුණු 1×3 = 3)

ii. ඉහත ක්‍රමවලට අමතරව මිශ්‍රණයක සංඝටක වෙන් කරන වෙනත් භෞතික ක්‍රමයක් ලියන්න. (ලකුණු 01)

C. Na පරමාණුවේ පරමාණුක ක්‍රමාංකය හා ස්කන්ධ ක්‍රමාංකය සම්මත ආකාරයට පහත දක්වා ඇත.

$^{23}_{11}Na$

i. Na පරමාණුවේ පරමාණුක ක්‍රමාංකය කීයද? (ලකුණු 01)

ii. මෙම Na පරමාණුවේ නියුට්‍රෝන සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. A පහත දැක්වෙන්නේ රුධිරයේ අඩංගු සංඝටක කිහිපයකි.

a - රතු රුධිරාණු b - සුදු රුධිරාණු c - රුධිර පට්ටිකා d - රුධිර ප්ලාස්මාව

i. ඉහත සංඝටක අතරින් රුධිරයේ බහුලව ම ඇති සංඝටකය කුමක් ද? (ලකුණු 01)
ii. සුදු රුධිරාණු වල කාර්යය කුමක් ද? (ලකුණු 01)
iii. මිනිස් හෘදයේ සිට පෙනහලු දක්වා රුධිරය ගෙනයන ධමනිය කුමක් ද? (ලකුණු 01)
iv. රුධිර පාරවිලයනය යන්න හඳුන්වන්න. (ලකුණු 01)
v. O^- රුධිර ඝනය ඇති ප්‍රතිග්‍රාහකයෙකුට රුධිර පාරවිලයනය කළ හැකි දායකයකු තුළ තිබිය යුතු රුධිර ඝනය කුමක් ද? (ලකුණු 01)
vi. රුධිර සංසරණ පද්ධතිය නිරෝගීව තබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න. (ලකුණු 01)

B යකඩ ඇණයක් මත තඹ ලෝහය ආලේප කිරීම සඳහා සැකසූ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ.



i. a නම් කරන්න. (ලකුණු 01)
ii. යකඩ ඇණය යොදා ඇත්තේ ධන ඉලෙක්ට්‍රෝඩය ලෙස ද ඍණ ඉලෙක්ට්‍රෝඩය ලෙස ද? (ලකුණු 01)
iii. භාජනයට යොදා ඇති ද්‍රාවණයේ වර්ණය කුමක් ද? (ලකුණු 01)
iv. ක්‍රියාකාරකම සිදුකරන විට ද්‍රාවණයේ වර්ණ වෙනසක් සිදුවේ ද? (ලකුණු 01)
v. ගුණාත්මක ලෝහාලේපනයක් ලබාගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න. (ලකුණු 01)

04. A පහත දැක්වෙන්නේ ශිෂ්‍යයෙක් කළ ක්‍රියාකාරකමකට අදාළ රූප සටහනකි.



i. බලය මැනීමට යොදාගෙන ඇති *x* උපකරණය නම් කරන්න. (ලකුණු 01)
ii. ඉහත යොදන ලද බලය සම්මත ආකාරයට නිරූපණය කරන්න. (ලකුණු 03)
iii. බලය යෙදීම මගින් වස්තුවක කළහැකි වෙනස්කමක් ලියන්න. (ලකුණු 01)
iv. බලය දෛශික රාශියක් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

B පහත රූපයේ දැක්වෙන පරිදි ජලය පුරවන ලද බෝතලයක් ස්පොන්ජ් කැබැල්ල මත තබා දර්ශකය පෙන්වන පාඨාංකය සටහන් කරගන්නා ලදී.



i. මෙම බෝතලය යටිකුරු කර ස්පොන්ජ් කැබැල්ල මත තැබූ විට දර්ශකය පෙන්වන පාඨාංකය අඩුවේ ද? වැඩිවේ ද? (ලකුණු 01)
ii. එසේ වීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 02)
iii. මෙම ක්‍රියාකාරකමෙන් පැහැදිලි වන්නේ පීඩනය කෙරෙහි කුමන සාධකයේ බලපෑම ද? (ලකුණු 01)
v. එදිනෙදා ජීවිතයේ දී පීඩනය වැඩි කරගන්නා අවස්ථාවක් සඳහා උදාහරණයක් ලියන්න. (ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. A පහත දැක්වෙන්නේ ආලෝක කිරණයක් තල දර්පණයකින් පරාවර්තනය වන ආකාරයයි.



i. ආලෝක පරාවර්තනය හඳුන්වන්න. (ලකුණු 01)

ii. BC කිරණය නම් කරන්න. (ලකුණු 01)

iii. පරාවර්තන නියම වලට අනුව x හා y කෝණ අතර සම්බන්ධය කුමක් ද? (ලකුණු 01)

iv. තල දර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බවල ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

v. පහත දක්වා ඇත්තේ සුමට පෘෂ්ඨයකට පතනය වන ආලෝක කිරණ කිහිපයකි. ඒවා පරාවර්තනය වන ආකාරය ඇඳ පෙන්වන්න. (ලකුණු 02)



vi. සුදු ආලෝකය සමන්විත වන වර්ණ හත වෙන්කර දැකගැනීමට භාවිත කළ හැකි උපකරණයක් ලියන්න. (ලකුණු 01)

B පරිසරයේ හට ගන්නා ධ්වනි විවිධ බාධක හමුවේ නිරතුරුවම පරාවර්තනයට ලක්වේ.

i. ධ්වනි පරාවර්තනය නිසා ඇතිවිය හැකි සංසිද්ධියක් ලියන්න. (ලකුණු 01)

ii. ධ්වනි පරාවර්තනයේ ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 01)

iii. ධ්වනි පරාවර්තනය අවාසිදායක වන අවස්ථා වල දී එය වැළැක්වීමට යොදා ගන්නා උපක්‍රමයක් ලියන්න. (ලකුණු 01)

06. A සංකීර්ණ යන්ත්‍ර නිර්මාණය වී ඇත්තේ සරල යන්ත්‍ර ගණනාවක් එකලස් වීමෙනි.

i. සරල යන්ත්‍රයක් යන්න හඳුන්වන්න. (ලකුණු 01)

ii. පා පැදියක් තුළ පහත ස්ථානවල ක්‍රියාත්මක වන සරල යන්ත්‍ර වර්ගය නම් කරන්න.

(a) පැඩලය (b) තිරිංග **(ලකුණු 02)**

iii. 10kg වස්තුවක් ආනත තලයක ආනතිය වෙනස් කරමින් ඉහළට අදින අවස්ථා දෙකක රූප සටහන් පහත දැක්වේ.



(a අවස්ථාව)



(b අවස්ථාව)

(a) දුනු තරාදි පාඨාංකය වැඩි අගයක් ගන්නේ කුමන අවස්ථාවේ දී ද? (ලකුණු 01)

(b) එම නිරීක්ෂණයට අනුව එළඹෙන නිගමනය කුමක් ද? (ලකුණු 01)

(c) ආනත තලය යෙදෙන අවස්ථා සඳහා උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

B නැනෝ තාක්ෂණය මගින් ඉදිරියේ දී ලොව තුළ විප්ලවකාරී වෙනසක් සිදුවනු ඇතැයි බොහෝ දෙනාගේ මතයයි.

i. වඩා කාර්යක්ෂම නැනෝ නිෂ්පාදන නිර්මාණය කළ යුත්තේ කුමන පරාසයේ නැනෝ අංශු භාවිතයෙන් ද? (ලකුණු 01)

ii. ස්වභාවික නැනෝ පද්ධතියක් නම් කරන්න. (ලකුණු 01)

iii. මූලික නැනෝ නිෂ්පාදනයක් සඳහන් කරන්න. (ලකුණු 01)

iv. නැනෝ තාක්ෂණයේ අහිතකර ප්‍රතිඵලයක් ලියන්න. (ලකුණු 01)

07. A ශිෂ්‍යයෙකුගේ පරිසර පද්ධති අධ්‍යයන පොතක තිබූ එක්තරා ප්‍රදේශයක රූප සටහනක් පහත දැක්වේ.

i. පරිසර පද්ධතියක් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

ii. රූපයේ අන්තර්ගත ස්වාභාවික පරිසර පද්ධති අතරින් එක් පරිසර පද්ධතියක නම ලියන්න.(ලකුණු 01)

iii. ප්‍රදේශයේ පවතින වැසි ජල කළමනාකරණයට දායක වන පරිසර පද්ධතිය කුමක් ද? (ලකුණු 01)

iv. කර්මාන්තයක් මඟින් පරිසරයට සිදුවන අහිතකර බලපෑමක් ලියන්න. (ලකුණු 01)

v. පළිබෝධ පාලනය සඳහා යොදා ගන්නා සාම්ප්‍රදායික කෘෂි උපක්‍රමයක් ලියන්න. (ලකුණු 01)

vi. ප්‍රදේශයේ හරිත නිවාස භාවිත වන බව පෙන්වා දීමට කරුණක් සඳහන් කරන්න. (ලකුණු 01)

B ඇතැම් ස්වාභාවික ආපදා මෑත ඉතිහාසයේ වැඩි වශයෙන් දක්නට ලැබේ. එයට හේතුව ගෝලීය උණුසුම ඉහළ යාම බව විද්‍යාඥයින්ගේ අදහසයි.

i. ගෝලීය උණුසුම ඉහළ යාමට බලපාන ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 01)

ii. සමකය ආසන්න ප්‍රදේශයට ලැබෙන සූර්ය ශක්තිය ලොව පුරා බෙදාහරින ප්‍රධාන යාන්ත්‍රණය සඳහන් කරන්න. (ලකුණු 01)

iii. ස්වාභාවික ආපදා නිසා ඇතිවන හානි අවම කර ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න. (ලකුණු 01)

iv. සුනාමි ඇතිවීමට හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

විද්‍යාව

පිළිතුරු පත්‍රය

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුර
01.	1
02.	2
03.	1
04.	4
05.	2
06.	1
07.	2
08.	1
09.	4
10.	3

ප්‍රශ්න අංකය	පිළිතුර
11.	3
12.	2
13.	1
14.	1
15.	3
16.	2
17.	4
18.	1
19.	3
20.	1

(ලකුණු 2×20=40)

II කොටස

01. A i. ප්‍රගණ්ඩ අස්ථිය (ලකුණු 01) ii. D (ලකුණු 01) iii. ත්‍රි ශීර්ෂ පේශිය (ලකුණු 01)
iv. • පෙසල තන්තු ආකාරයට පිහිටීම • සංකෝචනය වීමට ඇති හැකියාව • ඉහිල්වීමට ඇති හැකියාව
(එකකට ලකුණු 01)
v. (a) උත්තේජය (ආලෝකය) දෙසට චලනය සිදුවීම (ලකුණු 01) (b) ඍණ ගුරුත්වා වර්තී (ලකුණු 01)
vi. ගැළපෙන (නිදිකුම්බා/කතුරුමුරුංගා වැනි) (ලකුණු 01)
B i. ගැළපෙන උදාහරණයකට (ලකුණු 01) ii. කලපු / ගංමෝය (ලකුණු 01)
iii. මුහුදු ගංගා වැනි (ලකුණු 02)
iv. කුරු ශාක/කඳන් ඇඹරී තිබීම/පත්‍ර කුඩාවීම/මුදුන් පැතලිවීම (ලකුණු 01)
C i. x - තෙදඬු තුලාව (ලකුණු 01) ii. අසමාන වේ (ලකුණු 01)
iii. ද්‍රව දෙකේ ඝනත්ව වෙනස් වීම (ලකුණු 01) iv. අදාළ අවස්ථාවකට (ලකුණු 01) (මුළු ලකුණු 16)

02. A i. (a) සංශුද්ධ ද්‍රව්‍ය (b) සමජාතීය මිශ්‍රණ/ද්‍රාවණ (ලකුණු 02)
ii. • මූල ද්‍රව්‍ය එකම පරමාණු වලින් සෑදී ඇත.
• සංයෝග එකිනෙකට වෙනස් මූලද්‍රව්‍ය පරමාණුවලින් සමන්විත වීම. (ලකුණු 02)
iii. සංයෝග (ලකුණු 01)
B i. (a) - D (b) - B (c) - C (ලකුණු 03) ii. අදාළ පිළිතුරකට (ලකුණු 01)
C i. 11 (ලකුණු 01) ii. 12 (ලකුණු 01) (මුළු ලකුණු 11)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. A i. රුධිර ප්ලාස්මාව (ලකුණු 01) ii. විෂබීජ විනාශ වීම (ලකුණු 01) iii. පුප්ඵුසීය ධමනිය (ලකුණු 01)
iv. එක් අයෙකුගේ රුධිරය තවත් පුද්ගලයෙකුට ශරීරගත කිරීම (ලකුණු 01) v. O රුධිර ගණය (ලකුණු 01)
vi. ගැළපෙන පිළිතුරකට (ලකුණු 01)
B i. a - තඹ පතුර (ලකුණු 01) ii. ඍණ ඉලෙක්ට්‍රෝඩය (ලකුණු 01) iii. නිල් පැහැය (ලකුණු 01)
iv. සිදුනොවේ (ලකුණු 01)
v. • තනුක ද්‍රාවණයක් භාවිතය • අඩු විදුලි ධාරාවක් හා අඩු විභව අන්තරයක් යෙදීම (ලකුණු 01)
(මුළු ලකුණු 11)

04. A i. නිව්ටන් තුලාව/දුනු තරාදිය (ලකුණු 01)
ii. අදාළ නිරූපනයට (බලයේ දිශාව, විශාලත්වය හා උපයෝගි ලක්ෂ්‍යය නිරූපණය වූ විට) (ලකුණු 03)
iii. නිවැරදි පිළිතුරකට (ලකුණු 01)
iv. විශාලත්වයක් හා දිශාවක් පැවතීම (ලකුණු 01)
B i. වැඩිවේ. (ලකුණු 01) ii. පීඩනය වැඩිවීම (ලකුණු 02) iii. වර්ගඵලය (ලකුණු 01)
iv. ඇණයක තුඩ සිහින් කිරීම/පිහිවල මුවහත වැනි පිළිතුරක් (ලකුණු 01) (මුළු ලකුණු 11)

05. A i. ආලෝකය යම් පෘෂ්ඨයක් මත පතනය වී එම මධ්‍යයටම හැරී ගමන් කිරීම (ලකුණු 01)
ii. පරාවර්තන කිරණය (ලකුණු 01) iii. X හා Y සමාන වීම (ලකුණු 01)
iv. • උඩුකුරු බව/වස්තුවට සමාන වීම • පාර්ශ්වික අපවර්තනය/අතාත්වික/වස්තු දුරට සමානයි (ලකුණු 02)
v.



(ලකුණු 02) vi. ප්‍රිස්මය (ලකුණු 01)

B i. දෝංකාරය/අනුනාදය (ලකුණු 01)
ii. • අධි ධ්වනි පරිලෝකනය • සෝනාර් මගින් සාගරයේ ගැඹුර මැනීම වැනි (ලකුණු 01)
iii. තිරරෙදි යෙදීම/බිත්ති රළු කිරීම වැනි (ලකුණු 01)
(මුළු ලකුණු 11)

06. A i. වැඩ පහසු කිරීමේ සරල උපක්‍රමයක් (ලකුණු 01)
ii. (a) චක්‍රය හා අක්ෂ දණ්ඩ (ලකුණු 01) (b) ලීවර (ලකුණු 01)
iii. a - අවස්ථාව (ලකුණු 01) b - ආනතිය අඩුවන විට ආයාසය වැඩිවේ. (ලකුණු 01)
c - ඉනිමග/පඩිපෙළ/ස්කුරුප්පු ඇණය වැනි (ලකුණු 02)
B i. 1nm සහ 100nm අතර (ලකුණු 01) ii. සෛලය (ලකුණු 01) (ගැළපෙන පිළිතුරක් සඳහා)
iii. කාබන් බකි බෝල / නැනෝ නළ (ලකුණු 01)
iv. ගැළපෙන පිළිතුරකට (ලකුණු 01) (මුළු ලකුණු 11යි)

07. A i. කිසියම් ප්‍රදේශයක ජීවත්වන සියලුම ජීවී ප්‍රජා හා ඔවුන් සමඟ අන්තර් ක්‍රියාකරන භෞතික පරිසරය එක්ව ගත් කල පරිසර පද්ධතියකි. (ලකුණු 02) ii. ගංගාව (ලකුණු 01) iii. වැව (ලකුණු 01)
iv. අධික ශබ්දය/විෂවායු, දුම්, දූලි පිටවීම/අධික තාපය පිටවීම, දූෂිත ජලය ජලාශවලට එකතුවීම/හානිකර රසායන ද්‍රව්‍ය මුදාහැරීම (ලකුණු 01) v. ගැළපෙන පිළිතුරකට (ලකුණු 01)
vi. සූර්ය පැනල භාවිතය/සුළං බලාගාර/වැසි ජල ටැංකි භාවිතය (ලකුණු 01)
B i. හරිතාගාර වායු ප්‍රතිශතය ඉහළයාම (ලකුණු 01) ii. සුළි සුළං (ලකුණු 01)
iii. දැනුවත්වීම/අනුවර්තනය/ආරක්ෂිත පූර්වෝපායන් වැනි ගැළපෙන පිළිතුරකට (ලකුණු 01)
iv. භූ කම්පන / නායයෑම් / උල්කාපාත කඩාවැටීම් වැනි (ලකුණු 01)
(මුළු ලකුණු 11යි)